ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය: PS/GPA/Circular/04/2020
2020 ජනවාරි මස 21 වන දින

**සියලුම දිසාපතිවරුන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්**
**සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත**

**බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය මගින් අඩු ආදායම්ලාභීන් 100,000 ක් වෙත රැකියා ලබාදීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම**

ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් තුළ ඉහළ සමාජ සුබසාධනයක් පවත්වා ගැනීම උදෙසා අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජිකයින්හට ස්ථාවර ආදායම් මාර්ග ඇති කරමින් ඉතා කඩිනමින් ඔවුන්ට රජයේ රැකියා අවස්ථා ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු රජය විසින් 2020 ජනවාරි මස 20 වන දින සිට ආරම්භ කර ඇත.

මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් සුවිශේෂී ශ්‍රම සංචිතයක් නිර්මාණය කරනු ඇත. වෘත්තියවේදීන් විසින් කළමණාකරනය කරනු ලබන එම ශ්‍රම සංචිතය, අඩු අධ්‍යාපනික සුදුසුකම් සහිත හා අඩු ආදායම්ලාභී ගණයෙහිලා සැලකෙන පිරිස විවිධ නිපුණතාවයන්ගෙන් සමන්විත පිරිසක් බවට පත්කර රජයේ මෙන්ම රජයේ නොවන බහුවිධ සේවා සපයන්නන් බවට පත්වීමට අවකාශ සලසා දීම අපේක්ෂා කෙරේ.

අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව පිහිටුවා ඇති "බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය" මගින් අඩු අධ්‍යාපනික සුදුසුකම් ලත් තරුණ තරුණියන් 100,000 ක් බඳවාගැනීමට කටයුතු කරනු ඇත. මෙකී පිරිසට අයත් වනුයේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ට පහළ අධ්‍යාපනයක් ලත් වයස අවුරුදු 18-45 අතර කාණ්ඩයේ රැකියා විරහිත තැනැත්තන් පමණකි. බඳවා ගනු ලබන සාමාජිකයන්හට වෘත්තීය පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව ඔවුන් සේවයෙහි ස්ථිර කරනු ලැබේ. සේවා නියුක්තිකයන්හට ස්වකීය පවුල් දිවියෙන් දුරස්ථ වීමක් සිදු නොවන පරිද්දෙන් තමන් පදිංචි පෙදෙස් වලට නුදුරෙන්ම පිහිටි සේවා ස්ථානයන්හි රාජකාරී පවරනු ඇත. ඔවුනගේ සතුටුදායක සේවය හා විනය මෙන්ම, ඉහළ කාර්යසාධනය ද සැලකිල්ලට ගනිමින් පසුව විදෙස් රැකියා සඳහා යොමු කිරීමට ද කටයුතු කරනු ලැබේ.

මෙම කාර්ය සාධක බලකාය මගින් දිළිඳු පවුල්වලට මුල්තැන දෙමින් බඳවාගැනීම් සිදුකෙරෙනු ඇත. ඒ අනුව, පහත දක්වා ඇති කරුණුවලට විශේෂ අවධානය යොමුකරමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා මෙන් දන්වමි.

- දැනටමත් ප්‍රසිද්ධ කර ඇති පරිදි, අයදුම්කරුවන් විසින් පුවත්පත් දැන්වීමේ සඳහන් ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් 2020.02.15 වන දිනට පෙර තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වෙත භාරදිය යුතුය.
- අදාළ ග්‍රාම නිලධාරි විසින් එම තොරතුරු සහතික කර තම ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් වෙත 2020.02.20 වන දිනට පෙර භාර දිය යුතුය. ග්‍රාම නිලධාරි විසින් තොරතුරු තහවුරු කරගැනීමේ දී ප්‍රදේශයේ බිම් මට්ටමේ සිටින සමෘද්ධි නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් මෙන්ම ප්‍රදේශයේ පූජක පක්ෂයෙන්, කොට්ඨාසය භාර මහජන නියෝජිතයාගෙන් කරුණු විමසිය හැකිය. වැරදි තොරතුරු තහවුරු කිරීම රැකියාව අත්හිටුවීම ඇතුලු විනය ක්‍රියාමාර්ග ගැනීමට යටත්වන බව ද තරයේ අවබෝධ කරගත යුතුය.



ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

- ප්‍රාදේශීය ලේකම්වරුන් වරින් වර මෙම කටයුතු අධීක්ෂණය කරමින් "රැකියා කළහැකි දිළිඳුම පවුල්වලට මුල්තැන" ලැබෙන පරිදි මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මකවීම සනාථ කිරීමට කටයුතු කළ යුතුය.
- ප්‍රාදේශීය ලේකම් විසින් ග්‍රාම නිලධාරීන් වෙතින් ඉදිරිපත් කෙරෙන තොරතුරු/ අයදුම්පත්‍ර මනා ලෙස ලේඛනගත කිරීම 2020.02.25 දින වන විට සම්පූර්ණ කළ යුතුය.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරන වෙනත් පොදු ස්ථානවල දී තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ, "බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය" විසින් 2020.02.26 වන දින සිට දින 05 ක් තුළ පවත්වනු ලැබේ. අයදුම්කරුවන් එම සම්මුඛ පරීක්ෂණ සඳහා පැමිණෙන විට ග්‍රාම නිලධාරි සහතික හා වෙනත් ලියවිලි ඇත්නම් ඒවා ඉදිරිපත් කළ යුතුය.
- තෝරාගත් අයදුම්කරුවන්හට බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකායේ පුහුණුවීමේ පත්වීම් ලිපිය අදාළ ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරි මඟින් ලබාදීමට කටයුතු කරනු ලැබේ.
- පුහුණුවීම් කටයුතු 2020.03.02 දින ආරම්භ කිරීමට නියමිත අතර, පුහුණු වීමේ කාලය තුළ මසකට රු 22,500/- ක දීමනාවක් ගෙවනු ලැබේ.
- මනා පුහුණුලාභීන් 2020.10.01 දින සිට විශ්‍රාම වැටුප් හිමි ස්ථිර සේවකයින් බවට පත්කෙරෙනු ඇත.

ඒ අනුව, මේ සමඟ ඉදිරිපත්කර ඇති ආදර්ශ ආකෘතිය අනුව සැකසූ අයදුම්පත්‍ර ඔබ කාර්යාලය හා ග්‍රාම නිලධාරි කාර්යාල මඟින් අදාළ අයදුම්කරුවන්ට ලබාදීමට කටයුතු සලස්වන්න. එසේම ග්‍රාම නිලධාරීන් විසින් තහවුරු කරන ලද අයදුම්පත්‍ර හා සහතික විධිමත්ව භාරගෙන ඉදිරි කටයුතු කිරීම සඳහා "බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය" සමඟ අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස ද කාරුණිකව දන්වමි.

මේ සම්බන්ධව යම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේනම්, "බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය" භාර නිලධාරී, විශ්‍රාමික මේජර් ජෙනරාල් නන්ද මල්ලවආරච්චි මහතා (011 2354354) අමතන මෙන් වැඩිදුරටත් දන්වමි.

**පී බී ජයසුන්දර**
ජනාධිපති ලේකම්

පිටපත්:

| | | |
|---|---|---|
| **අග්‍රාමාත්‍ය ලේකම්** | - | කරු. දැ.ග.ස. |
| **අමාත්‍ය මණ්ඩලයේ ලේකම්** | - | කරු. දැ.ග.ස. |
| **ලේකම්**, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - | කරු. සියලුම ප්‍රාදේශීය ලේකම්රුන්, ග්‍රාම නිලධාරීන් හා අදාළ නිලධාරීන් මේ සඳහා සම්බන්ධ කර, අවශ්‍ය කටයුතු කිරීම සඳහා සහ බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය සමඟ සම්බන්ධීකරණ කිරීම සඳහා |
| **අධ්‍යක්ෂ ජනරාල්** බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය | - | කරු. දැ.ගැ.ස. සහ අ.ක.ස. |

(ආදර්ශ අයදුම්පත)

| දිස්ත්‍රික්කය | |
|---|---|

බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ පුහුණුව ලැබීම සඳහා අයදුම් පත්‍රය

1. මුල් අකුරු සමඟ නම:

2. සම්පූර්ණ නම:

3. ස්ථිර ලිපිනය:

4. දුරකථන අංකය: ස්ථිර ............ ජංගම ............

5. උපන් දිනය:

 5.1 2020.02.15 දිනට වයස: අවුරුදු ...... මාස ...... දින ......

6. ජාතික හැඳුනුම්පත් අංකය:

 6.1 රියදුරු බලපත් අංකය (ඇත්නම්):
 (බර වාහන/ද්විත්ව කාර්ය
 වාහන/කෘෂි වාහන බලපත්)

7. ස්ත්‍රී/පුරුෂ භාවය:
 (අදාළ කොටුවේ X ලකුණ යොදන්න)

| ස්ත්‍රී | පුරුෂ |
|---|---|
| | |

8. විවාහක/අවිවාහක බව
 (අදාළ කොටුවේ X ලකුණ යොදන්න)

| විවාහක | අවිවාහක |
|---|---|
| | |

 8.1 විවාහක නම් බිරිඳ හෝ ස්වාමිපුරුෂයාගේ රැකියාව:............

 8.2 අවුරුදු 18 ට අඩු දරුවන් සංඛ්‍යාව:............

9. විශේෂ අවශ්‍යතා ඇති (ආබාධිත) සාමාජිකයන් ඇත්නම් ඒ පිළිබඳ විස්තර:
............
............

10. සමෘද්ධි සහනාධාර ලබන පවුලක් ද යන වග:
 (අදාළ කොටුවේ X ලකුණ යොදන්න)

| ඔව් | නැත |
|---|---|
| | |

 10.1 ඔව් නම්, සහනාධාරයේ වටිනාකම රු............

11. පුහුණුව සඳහා අවශ්‍ය භාෂා මාධ්‍යය:
 (අදාළ කොටුවේ X ලකුණ යොදන්න)

| සිංහල | දෙමළ |
|---|---|
| | |

12. පදිංචිය:

 12.1 පදිංචි දිස්ත්‍රික්කය:............

 12.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:............

 12.3 ග්‍රාම නිලධාරී වසම:............

13. ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් (ඔබ අධ්‍යාපනය ලබා ඇත්තේ කිනම් ශ්‍රේණියක් දක්වා ද යන වග)
............

14. වෙනත් සුදුසුකම්: (ශිෂ්‍ය භට, ක්‍රීඩා, බාලදක්ෂ, වඩු, මේසන්, විදුලි කාර්මික, පරිගණක හෝ වෙනත් පුහුණු)
............
............
............

15. අයදුම් කරන පුහුණු ක්ෂේත්‍ර (මෙම නිවේදනයේ සඳහන් පුහුණු ක්ෂේත්‍ර අනුව ඔබ කැමති හා ඔබ පදිංචි ප්‍රදේශයේ පවතින රැකියා අවස්ථාවලට ගැලපෙන ක්ෂේත්‍ර 04 ක් අනු පිළිවෙලින් සටහන් කරන්න.)

| පුහුණු ක්ෂේත්‍ර ලේඛනයේ අනු අංකය | ඔබ කැමති පුහුණු ක්ෂේත්‍ර |
|---|---|
| | |
| | |
| | |
| | |

ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සියළුම කොන්දේසිවලට එකඟවන බවත් මා රැකියාවක නිරත නොවන බවත් මෙම පුහුණුව සඳහා සහභාගිවීමට එකඟ වන බවත්, ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

............
අයදුම්කරුගේ අත්සන

දිනය:............